ක්‍රියාකාරකම 02

පහත අගයන් යොදා වෘත්තාකාර සහ ඉලිප්සාකාර හැඩතල නිර්මාණය කරන්න

| | | | | | |
|---|---|---|---|---|---|
| Width | 9cm | 50mm | 3.5cm | 3 in | 70mm |
| Height | 5cm | 20mm | 6cm | 3 in | 100mm |

වෘත්තයන්ගේ හැඩය ඉතා පහසුවෙන් වෙනස් කිරීමේ හැකියාව ඇති වන ලෙස යොදා ඇති සැකසුම් කිහිපයක් එම හැඩතලය Select කළ විට Property Bar තුළ පෙන්වයි. අප එම හැඩ පිළිබඳව විමසා බලමු.

Pie Shape

ඔබ වෘත්තය ඇඳ එම හැඩතලය Select කළ විට Property Bar තුළ Pie Shape සැකසුම පෙන්වයි. එය ලබා දුන විට පහත ආකාරයේ හැඩයක් නිර්මාණය වේ.






Pie Shape යන හැඩය තවදුරටත් වෙනස් කිරීමේ හැකියාව එම සැකසුමට පසුව Property Bar තුළ පෙන්වන Starting and Ending Angles යන සැකසුමේ අගය වෙනස් කිරීමෙන් සිදු කළ හැක.






අගයන් යොදා Starting and Ending Angles වෙනස් කර පහත හැඩයන් නිර්මාණය කරන්න.



මෙම සැකසුම සමඟ ඇති Change Direction යන සැකසුමෙන් දැනට ඇඳ ඇති වෘත්ත කොටසට ප්‍රතිවිරුද්ධ දිශාගතකොටස එකවර නිර්මාණය කර ගත හැක.




උදා :-



Change Direction ලබා දීමට පෙර



Change Direction ලබා දීමට පසු